*සැ. යු.*– 2007.09.21 වැනි දින පළකරන ලද 1,516 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,517 - 2007 සැප්තැම්බර් 28 වැනි සිකුරාදා - 2007.09.28

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 1084 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 1085 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 995 |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 1087 |
| රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 1090 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ඔක්තෝබර් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 සැප්තැම්බර් මස 21 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය- වවුනියාව

2008 වර්ෂය සඳහා අවශ්‍ය සැපයීම්/සේවාවන්

01. වවුනියාව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාසයට අයත් රෝහල්වලට පහත දැක්වෙන සැපයීම්/සේවාවන් සඳහා ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ.

*(අ)* නොපිසන ලද/පිසන ලද ආහාර සැපයීම;
*(ආ)* කිලුටු රෙදි සේදීම.

02. 2008 වර්ෂයේ ජනවාරි මස 01 වන දා සිට දෙසැම්බර් මස 31 වන දින තෙක් වූ කාල පරිච්ඡේදය සඳහා මෙම සැපයීම් සේවාවන් සඳහා ශ්‍රී ලාංකිකයින්ගෙන් *නැතහොත්* ශ්‍රී ලංකාවේ වෙළෙඳ ආයතනවලින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් ලියකියවිලි 2007.10.01 වැනි දින සිට 2007.10.17 වැනි දින පස්වරු 3.30 දක්වා වවුනියාව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් නිකුත් කරනු ලැබේ. එක් රෝහලක්/ සංකීර්ණයක් සඳහා නියමිත එක් සැපයීම්/සේවා සඳහා වන ලියකියවිලි කට්ටලයක් පමණක් නිකුත් කරනු ලැබේ.

03. රජයේ කොන්ත්‍රාත්තු නොකළ හැකි පරිදි තහනම් කරන ලද අය හෝ තහනම් කරන ලද ආයතනවලට හෝ ටෙන්ඩර් පත් නිකුත් කරනු නොලැබේ.

04. ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇති අය පහත දැක්වෙන මුදල් ප්‍රමාණය ගෙවිය යුතු අතර ආහාර සැපයීම, රෙදි සේදීම යනාදී හා සම්බන්ධ වටිනාකම් ලියකියවිලි ද වවුනියාව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත ඉදිරිපත් කර ටෙන්ඩර් ලියකියවිලි ලබාගත හැකිය. ටෙන්ඩර්පත් 2007.10.24 වැනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

05. තැන්පත් කිරීමේ ප්‍රමාණය හා ලියකියවිලි

*(අ) නොපිසන ලද/පිසන ලද ආහාර සැපයීම* :

| *රෝහල* | *ආපසු නොගෙවන තැන්පත් ප්‍රමාණය රු. ශ.* | *ආපසු ගෙවන තැන්පත් ප්‍රමාණය රු. ශ.* | *වටිනාකමේ සහතිකය රු. ශ.* |
|---|---|---|---|
| දිස්ත්‍රික් රෝහල 01. සෙට්ටිකුලම් | 500 0 | 30,000 0 | 1,00,000 0 |
| සුට්රියල් අංශය 01 (නෙඩුන්කේනි) | 500 0 | 25,000 0 | 75,000 0 |
| ග්‍රාමීය රෝහල 01 (උලුක්කුලම්) | 250 0 | 10,000 0 | 25,000 0 |
| මධ්‍යම බෙහෙත්හල හා මාතෘ නිවාසය 05, (පූවරසන්කුලම්, පුලියන්කුලම්, නේරියකුලම්, සිදම්පරපුරම්, මාමඩුව) | 250 0 | 15,000 බැගින් | 25,000 බැගින් |
| දිස්ත්‍රික් ආයුර්වේද රෝහල 01 (ජම්පෙයිමඩු) | 250 0 | 25,000 0 | 75 ,000 |

*(ආ) කිලුටු රෙදි සේදීම*

| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික් රෝහල 01 (සෙට්ටිකුලම්) | 150 0 | 5,000 0 | 15,000 0 |
| සුට්ටියල් අංශය (01) නෙඩුන්කේනි | 100 0 | 1,500 0 | 5,000 0 |
| ග්‍රාමීය රෝහල 01 (උලුක්කුලම) | 100 0 | 1,000 0 | 5,000 0 |
| මධ්‍යම බෙහෙත් ශාලාව හා මාතෘ නිවාසය 05 (පූවරසන්කුලම, පුලියන්කුලම්, නේරියකුලම්, සිදම්බරපුරම් මාමඩුව | 100 0 | 1,500 0 බැගින් | 5,000 0 බැගින් |
| දිස්ත්‍රික් ආයුර්වේද රෝහල (01) ජම්පෙයිමඩු | 100 0 | 1,500 0 | 5,000 0 |

*(ඇ) ලියකියවිලි. –*

01. 2007.10.01 වන දායින් පසුව ඒ ඒ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් තමන්ගේ දේපොළවල වටිනාකම සහතික කිරීමේ සහතිකය (පී. එස්. එම්. 201 පොදු 170 ආකෘතිය) *නැතහොත්* බැංකුවේ වගකීම් ලිපිය.

02. මීට පෙර සිටම සේවාව ලබාදෙන කොන්ත්‍රාත්කරුවන් ඊළඟ කාලය සඳහා නවකයින් ලෙස සලකා තීරණ ගනු ලැබේ.

03. ටෙන්ඩර් වේලාව පසු වූ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ඉල්ලුම්කරු හෝ ලිඛිතව පත් කරන ලද නියෝජිතයෙකු හෝ ටෙන්ඩර් විවෘත කිරීමේ දී පැමිණ සිටිය හැකිය.

04. ටෙන්ඩර් පිළිබඳව ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

05. වැඩි විස්තර කෙලින් ම හෝ *නැතහොත්* දුරකථන අංක 024 - 2222140 මගින් *නැතහොත්* ගණකාධිකාරි, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයෙන් ලබාගත හැකිය.

වෛද්‍ය පී. පසුපතිරාජා මිය,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

ප්‍රාදේශීය සෞඛ්‍යසේවා කාර්යාලය,
වවුනියාව.

09-1135

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - රත්නපුර

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රත්නපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ වර්ෂ 2007.10.27 දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳ අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳ වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.00 සිට 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

වෙන්දේසියේ මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතුය. චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන් හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පත ද ඉදිරිපත් කළ යුතුය.

එන්. වී. කරුණාතිලක,
මහෙස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු,
රත්නපුර.

2007 සැප්තැම්බර් මස 06 වැනි දින,
රත්නපුර, මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | ඒ 959/06 | සිංගර් වර්ගයේ පාපැදිය |
| 02. | ඒ. 1094/06 | පාපැදි 01යි |
| 03. | ඒ. 1112/06 | කොම්පැෂර් 01යි, ඔක්සිජන් බට 01යි |
| 04. | ඒ 1144/06 | කෂිකා වර්ගයේ කැඩුන කැසට් යන්ත්‍ර 01යි ඇලුමිනියම් ජෝගු 01යි, නැෂනල් වර්ගයේ බ්ලෙන්ඩර් 01යි, ඉරුම් කියත් 02යි |
| 05. | ඒ 1155/06 | සෝනි එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථනය සහ චාජරය, මෝටරෝලා ජංගම දුරකථනය සහ චාජරය |
| 06. | ඒ 1194/06 | ඇඳුම් උදලු 08 යි, ටියුබ් 01යි, කැෂියෝ වර්ගයේ අත් ඔරලෝසු 01යි. |
| 07. | ඒ 1195/06 | ඇඳුම් උදලු 04යි |
| 08. | ඒ 1216/06 | මෝටරයක් සවිකරන ලද පාපැදි 01යි |
| 09. | ඒ 1318/06 | පාපැදි 02යි |
| 10. | ඒ 1321 06 | ඇඳුම් උදලු 09යි |
| 11. | ඒ 1441/06 | පාපැදි 01යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 12. | ඒ 1519/06 | අංක ජේඑෆ් 8935 දරන යතුරු පැදිය |
| 13. | 12742 | මුන්ඩා වර්ගයේ ගෑස් සිලින්ඩර 01යි රවුම් ගෑස් ලිප් 01යි |
| 14. | 58119 | පොරව 01යි |
| 15. | 17795 | දම්වැල් කියත් 01යි |
| 16. | 88091 | ගෘහ වතුර මෝටර් 01යි |
| 17. | 92060 | ගෘහ වතුර මෝටර 01යි |
| 18. | 33268 | කොම්පැෂර් 01යි, අඟල් 06 යේ හෝස්බට 01යි |
| 19. | 33907 | විලියස් වර්ගයේ අඟල් 02 කේ වතුර මෝටර් 01යි, හෝස් බට 01යි, ඉල්ලම් කුරු 01යි, උදලු 03යි, යකඩ මිටි 01යි |
| 20. | 35236 | රොබින් වර්ගයේ අඟල් 02 කේ වතුර මෝටර් 01යි හෝස් බට 01යි |
| 21. | 36614 | රොබින් වර්ගයේ වතුර මෝටර 01යි |
| 22. | 37956 | රතුපාට කොම්පැෂර යන්ත්‍ර 01යි |
| 23. | 40755 | වායු පීඩන යන්ත්‍ර 01යි, වායු ටැංකි 01යි |
| 24. | 43590 | විලියස් වර්ගයේ අඟල් 02 කේ වතුර මෝටර් 01යි |
| 25. | 45282 | කොම්පැෂර් 01යි, මවුත් එක සහිත අඩි 100ක් දිග ඔක්සිජන් බට 01යි |
| 26. | 48296 | කොම්පැෂර් 01යි, ඔක්සිජන් ටැංකි 01යි ස්ටාටර් මෝටර් 01යි, ඕල්ටනේටර් 01යි |
| 27. | 33984 | කොම්පැෂර් 01යි, බැටරි 02යි, උදලු 01යි |
| 28. | 48705 | කොම්පැෂර් 01යි, ඔක්සිජන් ටැංකි 01යි, මවුත් එක සහිත ඔක්සිජන් බට 01යි, කිමිදුම් කට්ටල 01යි, බැටරි 02යි |
| 29. | 59095 | ලොකු බාල්දි 02යි, පොඩි බාල්දි 02යි, සවල් 01යි, යකඩ බටයක් සහිත යකඩ 01යි |
| 30. | ඒ 1731/06 | විලියස් වර්ගයේ වතුර මෝටර් 01යි |
| 31. | ඒ 1467/06 | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 32. | ඒ 1825/06 | අංක එස්ජී 142 - 7122 දරන සුසුකි කේ 90 වර්ගයේ යතුරුපැදිය |
| 33. | ඒ 70/07 | විලියස් වර්ගයේ වතුර මෝටර 01යි |
| 34. | 42690 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 35. | 19001 | උදලු 01යි, ඉල්ලම් කුරු 01යි |
| 36. | 62132 | අඩි 12ක් දිග යකඩ 01යි |
| 37. | ඒ 357/07 | සවල් 05යි, බාල්දි 05යි |
| 38. | 8349 | වක් පිහි 01යි |
| 39. | 19003 | සෝනි එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථන 01යි, සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන 02යි, කොම්පැෂර් යන්ත්‍ර 01යි, ඉල්ලම්කුරු 01යි, ඔක්සිජන් බට 01යි. |
| 40. | ඒ 295/07 | වැසි අංක එල්එල්සීඑල්පීජේ 10x 41 බී 21255 හා එන්ජින් අංක එල්සී 147 එෆ්එම් සී ඕ 438696 දරන ලොන්සින් වර්ගයේ යතුරුපැදිය |
| 41. | ඒ 358/07 | කම්පැෂර් 01යි, කම්පැෂර් ටැංකි 01යි බැටරි 01යි, කහපාට රබර් බට 03යි, කිමිදුම් ඇදුම් කට්ටල 01යි |
| 42. | 43361 | අංක 75 - 7930 දරන අත් ට්‍රැක්ටරය සහ ඉරුම් බංකුව |
| 43. | බී 456/04 | එල්. ජී. වර්ගයේ දොර දෙකේ ශීතකරණ 01යි කැලි 03 නේ කුෂන් පුටු සෙට් 01යි |
| 44. | 43594 | අංක එස්ජී එස් බී 0275 දරන ෆාම් මාස්ටර් වර්ගයේ අත් ට්‍රැක්ටරය |
| 45. | 083 | කුළුගෙඩි 01යි |
| 46. | 7778 | පොරව 01යි |
| 47. | 8524 | වක් පිහි 01යි |
| 48. | 6723 | බන්ඩි කියත් 01යි, පොරව 01යි |
| 49. | 7704 | අත් කියත් 01යි, අඩු මිටි 01යි කැට යතු 01යි, කියත් 01යි |
| 50. | 41804 | වැය 01යි, කුළු ගෙඩි 01යි, උදලු 03යි, ඉල්ලම්කුරු 03යි වක් පිහි 01යි |
| 51. | 58119 | පොරව 01යි |
| 52. | 7350 | පොරව 01යි |
| 53. | 7298 | පොරව 01යි |
| 54. | 27084 | එකෝ වර්ගයේ දම්වැල් කියත් 01යි |
| 55. | 18628 | එෆ්කෝ වර්ගයේ යාන්ත්‍රික දම්වැල් කියත් 01යි |
| 56. | අංක රහිත | වක්පිහි 10යි |
| 57. | අංක රහිත | මාළු කපන පිහි 04යි |
| 58. | අංක රහිත | පොරව 01යි |
| 59. | අංක රහිත | යතු කැට 07යි, අත් කියත් 01යි, කියත් 06යි, පොඩි යකඩ මිටි 01යි, ස්කුරුප්පු නියන් 02යි, අතකොලු 03යි, ඇලුමිනියම් මට්ටම් ලී 01යි, මරක්කල් 01යි |
| 60. | අංක රහිත | කැති 02යි |
| 61. | අංක රහිත | ලොකු යතු කැට 01යි |
| 62. | අංක රහිත | පොරව 01යි, වැය 01යි |
| 63. | අංක රහිත | ඉරුම් කියත් 03යි |
| 64. | අංක රහිත | බන්ඩි කියත් 05යි |
| 65. | අංක රහිත | පරණ යකඩ කැබලි තොගයක් |
| 66. | අංක රහිත | හිස් බැරල් තොගයක් |
| 67. | අංක රහිත | හිස් බුලි තොගයක් |
| 68. | අංක රහිත | හිස් බෝතල් තොගයක් |
| 69. | අංක රහිත | තලන ලද තඹ දහර තොගයක් |
| 70. | අංක රහිත | ලී අල්මාරි 02යි |
| 71. | අංක රහිත | වානේ කැබිනට් 03යි |
| 72. | අංක රහිත | ඇඳි සහිත පුටු 20යි |
| 73. | අංක රහිත | සාමාන්‍ය පුටු 04යි |
| 74. | අංක රහිත | ඇඳි බැංකු 11යි |
| 75. | අංක රහිත | ඇඳි රහිත බංකු 04යි |
| 76. | අංක රහිත | කුඩා මේස 02යි |
| 77. | අංක රහිත | අංක 452966 දරන ඔප්ටිමා යතුරුලියනය අංක 547189 දරන ඔප්ටිමා යතුරුලියනය අංක 9405714 දරන ඔලිවෙට්ටි යතුරුලියනය අංක 659538 දරන පැසිට් යතුරුලියනය |
| 78. | අංක රහිත | ඇඹුම් උදලු තොගයක් |
| 79. | අංක රහිත | සවල් තොගයක් |
| 80. | අංක රහිත | උදලු තොගයක් |
| 81. | අංක රහිත | ලොකු සහ පොඩි බාල්දි තොගයක් |
| 82. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි තොගයක් |
| 83. | අංක රහිත | ඉල්ලුම්කුරු තොගයක් |
| 84. | අංක රහිත | යකඩ පත්ත තොගයක් |

09-919

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## සියලු දෙනාම මෙයින් දැන ගනිත්වා

දොඩන්දූව, කුමාරකන්ද, ගාලු පාර, අංක 42 හි දැනට අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල, පීරිස් වෙද මාවත, අංක 31/2 හි පදිංචි, කලුදේව අනුර ද සිල්වා වන මා ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. ජී. රාජපක්ෂ මහතා විසින් ලියා සහතික කළ අංක 690 හා 2002.12.13 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය වර්ෂ 2007.09.03 වැනි දින සිට අවලංගු කර ඇති බවත්, ඒ අනුව එකී අංක 690 දරන ඇටර්නි බලපත්‍රයේ ප්‍රකාර ඇටර්නි බලකරු වූ දොඩන්දූව, කුමාරකන්ද, ගාලු පාර, අංක 42 හි දැනට අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල පීරිස් වෙද මාවත, අංක 31/2 හි පදිංචි හදුන්නෙත්ති ඥානාංගී ප්‍රියන්තා චන්ද්‍රසිරි මෙන්ඩිස් මහත්මිය සමග කිසිදු කටයුත්තකට ඇතුළත් නොවන ලෙසත්, එකී කටයුතු වලට මා වග නොකියන බවත්, මෙයින් සියලු දෙනාම දැන ගනිත්වා.

කලුදේව අනුර ද සිල්වා.

09-1105

---

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධි විධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතන 02 සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී

සමාගමේ නම : මියුකි ඇන්ඩ් ට්‍රිලී කෝපරේෂන් (ප්‍රයිවට්)ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 61054
ලියාපදිංචි දිනය : 2007.08.16
ලියාපදිංචි ලිපිනය : අංක 182, කුළමුල්ල, වයික්කාල

සමාගමේ නම : බ්ලූමින් ඩ්‍රෙස් පොයින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 61053
ලියාපදිංචි දිනය : 2007.08.16
ලියාපදිංචි ලිපිනය : හලාවත පාර, මහවැව

ලේකම්,
සී. වී. අමරසිංහ.

අංක 61/49, අඹවත්ත පාර,
බොරලැස්ගමුව.

09-1106

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) මොරේතොට ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3217
3. සංස්ථාගත ගතකළ දිනය : 2007.07.18
4. සමාගමේ ලියාපදිංචි ලිපිනයː කොල්ලුවත්ත, හෙලමොරේතොට, හාලිඇල.

සමගාමී සභාපති.

09-1069

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2007 අගෝස්තු මස 17 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : කැප්ටන් ප්‍රොමෝෂන් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 61075
ලියාපදිංචි ලිපිනය : අංක 140, හැව්ලොක් පාර, කොළඹ 05.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සෙල්වර් රාජ් සුදේෂ්කුමාර්,
ලේකම්.

09-1076

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත දක්වා ඇති සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව අපි මෙසේ දැනුම් දී සිටිමු.

සමාගමේ නම : කන්සල්ටිං ඉංජිනියර්ස් ඇන්ඩ් ආකිටෙක්ට්ස් ඇසෝසියේටඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්)
සමාගමේ අංකය : පී. වී. 61110
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 500/5, තලපත්පිටිය පාර, මාදිවෙල, කෝට්ටේ.
සංස්ථාගත කරන ලද දිනය : 2007 අගෝස්තු මස 24 වැනි දින.

සමාගමේ අධ්‍යක්ෂවරු,
කන්සල්ටිං ඉංජිනියර්ස් ඇන්ඩ්
ආකිටෙක්ට්ස් ඇසෝසියේටඩ්
(ප්‍රයිවට්) ලිමිටඩ්.

09-962

---

## සමාගමක් සංස්ථාපිත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

පහත සඳහන් සමාගම් සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : සීමාසහිත ලංකා ගැසිෆයර්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 61164 දාතම : 2007.08.24
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 18/173, දාබරේ මාවත, කොළඹ 05.

සමාගමේ නම : සීමාසහිත යුනිවර්සල් පෙස්ට් කන්ට්‍රෝල් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 61165 දාතම 2007.08.24
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 306, මීනුවන්ගොඩ පාර, කොටුගොඩ.

සමාගමේ නම : සීමාසහිත ඩේටා පැක් ග්ලෝබල් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 61254 දාතම 2007.09.04
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 239/1, දෙහිවල පාර, බොරලැස්ගමුව

සමාගමේ නම : සීමාසහිත ඉන්ටර් ඕෂන් මැරීන් ලොජිස්ටික්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 61289 දාතම 2007.09.06
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 58/6, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ, කෝට්ටේ.

සීමාසහිත එකවුන්ටන්සි ඇන්ඩ් සෙකටේරියල්
සර්විසස් බියුරෝ සමාගම,
ලේකම්වරු,

2007 සැප්තැම්බර් මස 07 වැනි දින,
අංක 86, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල, නුගේගොඩ,

09-917

---

## සමාගමක් සංස්ථාපිත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

(34 වන වගන්තිය)

2007 අංක 7 දරන සමාගම් ආඥා පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි :

සමාගමේ නම : ඒසියා ටයර් ඉම්පෝටර්ස් ඇසෝසියේෂන්
සමාගමේ අංකය : පී. ඒ. 2016 දාතම 2007.08.14
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 221-1/2, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

සීමාසහිත එකවුන්ටන්සි ඇන්ඩ් සෙකටේරියල්
සර්විසස් බියුරෝ සමාගම,
ලේකම්වරු.

2007 අගෝස්තු මස 15 වැනි දින.
අංක 86, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල, නුගේගොඩ.

09-916

---

## සමාගමක නම වෙනස් කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥා පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි :

සමාගමේ කලින් තිබූ නම : සීමාසහිත සිසිල ජේන්ට් ඇන්ඩ් හාඩ්වෙයාර් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : එන්. (පී. වී. එස්) 16598 දාතම 1996.01.24
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 268, මැසෙන්ජර් වීදිය, කොළඹ 12,
සමාගමේ අළුත් නම : සීමාසහිත රොචැන්කෝ ජේන්ට්ස් (පුද්ගලික) සමාගම.
දාතම : 2007.08.22

සීමාසහිත එකවුන්ටන්සි ඇන්ඩ් සෙකටේරියල්
සර්විසස් බියුරෝ සමාගම,
ලේකම්වරු.

2007 අගෝස්තු මස 30 වැනි දින,
අංක 86, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල, නුගේගොඩ.

09-915

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

රාගම, කැන්දලියද්ද පාළුව, අංක 638/2 හි පදිංචි ජයකොඩි ආරච්චිගේ ඉනෝකා ශිරෝමාලි ජයකොඩි වන මම රාගම, කැන්දලියද්ද පාළුව, අංක 638/2 හි පදිංචි නානායක්කාරවසම් සංජීව ජයසිංහ යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද පියතිලක ගවරම්මාන ප්‍රසිද්ධ නොතාරිස් තැනගේ අංක 1075 සහ 2006.05.24 දින දරන ඇටෝර්නි බලය මෙයින් අවලංගු කරන බවත් එය තවදුරටත් වලංගු සහ බලසහිත නොවන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

ජයකොඩි ආරච්චිගේ ඉනෝකා ශිරෝමාලි ජයකොඩි.

09-924

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මීරහවත්ත, අංක 239/48/1 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 533600573 V හිමි හිටිහාමි මුදියන්සේලාගේ කරුණාරත්න වන මා ප්‍රසිද්ධ නොතාරිස් උපතිස්ස මඩපාතගේ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 616/2006/02/13 දින දරන ඇටෝර්නි බලපත්‍රයෙන් ඇටෝර්නි බලකරු වශයෙන් මීරහවත්ත "ජයරුවන්හි " පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 620141879 **V** හිමි හිටිහාමි මුදියන්සේලාගේ ගුණතිලක යන අය පත්කරන ලදී.

එකී ඇටෝර්නි බලපත්‍රය මෙම දැන්වීම පළකරනු ලබන දිනය වන 2007.09.28 දින සිට සම්පූර්ණයෙන් බලරහිත කර අවලංගු කරන බවට ශ්‍රී ලංකාවාසී සියලුම දෙනා වෙත මෙයින් දන්වා සිටින අතර ඉන්පසුව එකී ඇටෝර්නි බලපත්‍රය උපයෝගී කරන කිසියම් ක්‍රියාවකට මා වගකීම නොකියන බවද මෙයින් දන්වා සිටිමි.

මෙයට
හිටිහාමි මුදියන්සේලාගේ කරුණාරත්න.

2007 සැප්තැම්බර් මස 08 වැනි දින.

09-979

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත යටතෙහි එවර්ග්‍රීප් ඔටෝමොටිව් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නමින් ලියාපදිංචි කළ බව ප්‍රකාශ කරමි.

ලියාපදිංචි දිනය : 2007.08.13
සමාගමේ අංකය : පී. වී. 61003

අධ්‍යක්ෂක.

කර්මාන්තපුරය,
දෙවන අදියර,
කුරුවිට.

09-1128

## දැන්වීමයි

2007 අංක 17 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සිටිස් ඔෆ් රෙ-පියුජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 60862
ලියාපදිංචි දිනය : 2007.08.01

ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 97/ඊ, ආටිගල මාවත, කොලමුන්න, පිළියන්දල.

සමාගම් ලේකම්වරු,
කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්) සමාගම.

09-1155

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි.

සීමාසහිත සන්පැක් කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම, 2007 අංක 7 දරන සමාගම් පනතේ 27 වන වගන්තිය යටතේ සීමාසහිත සමාගමක් වශයෙන් 2007 වසරේ අගෝස්තු මස 2 වැනිදා සිට සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ අංකය - PV 60869
2. ලියාපදිංචි ලිපිනය - අංක 379 ඒ/1, පන්නිපිටිය පාර, කලල්ගොඩ

ලකී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.
අංක 227, රෝහල පාර,
කළුබෝවිල,
දෙහිවල.

09-1036

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

නිල්දණ්ඩාහින්න අංක 16 දරන ස්ථානයේ පදිංචි රණසිංහ බෙත්මගේ ජගත් රණසිංහ වන මම මහනුවර මහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසන් විභාගයට පෙනී සිටීම සඳහා 107 වන අධිකාරිය වන නොතාරිස් ආඥාපනතේ 07 වැනි වගන්ති ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව උතුම් වූ ශ්‍රී ලාංකික ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ආර්. බී. ජගත් රණසිංහ.

අංක 16,
නිල්දණ්ඩාහින්න.

09-1013

## දැන්වීමයි

2007 අංක 17 දරන සමාගම් පනතේ යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) 12-14 දරන සමගි ගැමිදිරිය සමාගම
සමාගමේ අංකය : පී. බී. 3271
සංස්ථාගත කළ දිනය : 2007.08.23
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : "ජනාවාස", 12-14 පැල්වත්ත සීනි සමාගම, බුත්තල.

සමාගම ලේකම්.

09-1118

## දැන්වීමයි

2007 අංක 17 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : පෙලිකන් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංකය : පී. වී 60716
සංස්ථාගත කළ දිනය : 2007.07.19
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය: අංක 1490/8, හෝකන්දර පාර, පන්නිපිටිය.

සමාගම් ලේකම්වරු,
කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්.) සමාගම.

09-1156

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 9 වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : පැන් මැරීන් ලොජිස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංකය : පී. වී 60981
ලියාපදිංචි ලිපිනය : අංක 95/3, පරණ පාර, නාවල
ලියාපදිංචි කළ දිනය : 2007.08.10

එන්. පී. පෙරේරා,
අධ්‍යක්ෂක.

09-185

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

රුපියල් පනස් දෙලක්ෂ හැට හය දහස් නමසිය දාහතයි ශත හැත්තෑපහ (රු. 5,266,917.75) මුදල මත වර්ෂ 2005 ක් වූ ජනවාරි මස 09 වැනි දින සිට තීන්දු ප්‍රකාශණ දිනය දක්වා වර්ෂයකට (28%) සියයට විසි අට බැගින් පොළිය ද ඉන් පසු එකී මුලු මුදල ගෙවා අවසන් කරනු ලබන තෙක් තීන්දු ප්‍රකාශයේ මුළු මුදල මත පොලිය ද නඩු ගාස්තු ද උසාවි වියදම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව අයකර ගැනීම පිණිස අංක 27/3, තෙලවල පාර, රත්මලානේ වසන කෝසල බණ්ඩාර බක්මීවැව, සුමිත්‍රා බක්මීවැව, සහ ආනන්ද බණ්ඩාර බක්මීවැව යන අයට විරුද්ධව එල්. බී. ෆිනෑන්ස් ලිමිටඩ්, අංක 275/75, මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත කොළඹ 7 විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ පවරන ලද අංක එච් සී (සිවිල්)/34/2005 (1) දරන නඩුවෙන් මා වෙත නිකුත්කරන ලද නියෝගය.

මා වෙත පවරා දී ඇති බලතල අනුව වර්ෂ 2007 ඔක්තෝබර් මස 26 වැනි දින පෙ. ව. 11.00 කනිසමට අංක 27/3, තෙලවල පාර, රත්මලාන යන ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ තෙලවල සහ කටුබැද්ද යන ගමෙහි පිහිටි ලේඩි කැතරින් ගෘප් නමැති ඉඩමට 1970.12.24 වැනි දින ඩී. එල්. පීරිස් බලයලත් මානක නිලධාරී තැන විසින් මැන සාදන ලද අංක 2241 දරන පිඹුරේ කැබලි අංක 10 දරන බිම් කැබැල්ලට (1970.12.13 වැනි දින ඩී. එල්. පීරිස් මානක නිලධාරීතැනගේ අංක 2238 දරන පිඹුරේ කැබලි අංක 08 දරන බිම් කැබැල්ලෙන් බෙදා වෙන් කරන ලද කොටසක්) එකී පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ඉහත කී අංක 2241 දරන පිඹුරේ කැබලි අංක 11 ද, නැගෙනහිරට : ඉහත කී අංක 2241 දරන පිඹුරේ කැබලි අංක 21 දරන අඩි 25ක් පළල පාරකට හැර තිබෙන බිම ද දකුණට : ඉහත කී අංක 2241 දරන පිඹුරේ කැබලි අංක 09 ද, බස්නාහිරට : ඉහත කී අංක 2241 දරන පිඹුරේ කැබලි අංක 03 දරන බිම් කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහ අටයි දශම දෙකක් (අ. 0 රූ. 0 පර්. 18.2) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති සෑම සියලු දේ ද වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2473/61 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ තෙලවල සහ කටුබැද්ද යන ගමෙහි පිහිටි ලේඩි කැතරින් ගෘප් නමැති ඉඩමට 1970.12.24 වැනි දින ඩී. එල්. පීරිස් බලයලත් මානක නිලධාරි තැන විසින් මැන සාදන ලද අංක 2241 දරන පිඹුරේ කැබලි අංක 21 දරන අඩි 25 පළල පාරකට හැරි තිබෙන බිම් කැබැල්ල (1970.12.13) වැනි දින ඩී. එල්. පීරිස් මානක නිලධාරීතැනගේ අංක 2238 දරන පිඹුරේ කැබැලි අක 08 දරන බිම් කැබැල්ලෙන් බෙදා වෙන් කරන ලද කොටසක්) ට එකී පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ඉහත කී අංක 2241 දරන පිඹුරේ කැබලි අංක 20 ද, නැගෙනහිරට : ඉහත කී අංක 2241 දරන පිඹුරේ කැබලි අංක 15, 16, 17, 18 සහ 19 දරන බිම් කැබැලි ද, දකුණට : තෙලවල ෆෙරී පාර ද, බස්නාහිරට : ඉහත කී අංක 2241 දරන පිඹුරේ කැබැලි අංක 8, 9, 10,11, 12, 13 සහ 14 දරන බිම් කැබැලි ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් පහයි දශම හතරක් (අ. 0 රූ. 0 පර්. 35.4) විශාල බිම් කැබැල්ල අඩි 25ක් පළල බිම් තීරුව පාරක් වශයෙන් පාවිච්චි කිරිමේ පරවශතා අයිතිය ද සමග වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2473/62 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසිය හැකි මාර්ගය.–* රත්මලානේ ගාලු පාරේ පිහිටි අන්ධ ගොලු පාසල සිට මොරටුව දෙසට කිලෝමීටරයක් පමණ ගිය විට වම් අත පැත්තට තෙලවල පාර හමුවේ. එම පාරේ යාර 100ක් පමණ ගිය විට වම් අත දෙසට ඇති කොකිල පෙදෙස පාරේ මීටර් 25ක් පමණ ගිය විට වම් අත පසට අංක 27/3 ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතුය.

1. 25% ගැනුම් මුදලින් ද,
2. 1% පළාත් පාලන ආයතන ගාස්තු සහ වැට් බද්ද ද,
3. 2 1/2% විකුණුම් මුදලින් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද,
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම හා සහතික කිරීම වෙනුවෙන් නොතාරිස් ගාස්තුව රු. 2,000 ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුලත ගැනුම් මිලේ පරිශේෂය වන 75% මුදල ඉහත සඳහන් නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩි විස්තර සඳහා ඒ. සල්ගාදු මහතා හෝ ප්‍රසන්න මහතා එල්. බී. ෆිනෑන්ස් ලිමිටඩ්, අංක 275/75, මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 7. දුරකථන අංකය : 4521000.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

09-1080

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - අම්බලන්තොට ශාඛාව

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ්ප් සිලෝන් ලිමිටඩ් විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර,

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තලහේ තල්පේ පත්තුව පිහිටි ගාල්ල දිසා අධිකරණයේ බෙදුම් නඩු අංක පි/6091 දරන නඩුවේ වාර්තාගත වූ බලයලත් මානක ඒ. වීරසිංහ විසින් 1995 අගෝස්තු මස 20 වැනි දින සාදන ලද අංක 344 දරන පිඹුර පරිදි පරගහවත්ත *හෙවත්* ගොඩපරගහවත්ත ඉඩමේ වෙන් කරන ලද ලොට් ඒ සහ බලයලත් මානක ඩී. වීරසේකර විසින් 1985 ඔක්තෝබර් 14, නොවැම්බර් 07, 18 සහ 20 දිනයන්හි සාදන ලද අංක 2161 දරන පිඹුරේ දෙල්ගහවත්ත *හෙවත්* කනත්තවත්ත ඉඩමේ ලොට් අංක 01 දරන

ඒකාබද්ධ ඉඩම් දෙකෙහි පිහිටි ගොඩනැගිලි, වගාවන් යන සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් බී දරන ඉඩම බලයලත් මානක ඒ. වීරසිංහ විසින් 2001 සැප්තැම්බර් මස 07 වැනි දින සාදන ලද අංක 827 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් තිස් හතයි දශම හයක් (අ. 0 රූ. 1 පර්. 37.6) හෝ හෙක්ටයාර් 0.1963 වේ.

කලුතොටගේ අමරවීර ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2007ක් වූ ඔක්තෝබර් මස 23 වැනි දින ප. ව. 1.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2001.07.21 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ ද*, දිවයින, අයිලන්ඩ් සහ තිනකරන් පත්‍ර ද, විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2007.09.28 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2007.10.01 වැනි දින දිවයින සහ අයිලන්ඩ් පත්‍ර ද බලන්න.

*ඉඩමට පිවිසීම.*– ගාල්ල සිට අකුරැස්ස මාර්ගයේ කිලෝමීටර් 07ක් පමණ ගොස් තලහේ රජයේ විදුහල පසුකර පදින්නොරුව සමූපකාර වෙළෙඳ සල අසළ ඇති 05 වන කිලෝමීටර් කණුව ලඟින් වමට ඇති පාසැල් පටුමඟට පිවි සෙන්න. මෙම ඉඩම ප්‍රාදේශීය සභා මාර්ගයේ දකුණු පැත්තේ ඇති 03 වන ඉඩම වන අතර ප්‍රධාන මාර්ගයේ සිට දුර මීටර් 50ක් පමණි.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකක් (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිළෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකාර සහ සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම් ද,
7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අම්බලන්තොට ශාඛාවේ හෝ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ
වෙන්දේසිකරු, තක්සේරුකරු සහ උසාවි
කොමසාරිස්, කොළඹ වාණිජ මහාධිකරණය,
සහ දිසා අධිකරණය, රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 99, උසාවි පාර, කොළඹ 12
දුරකථන සහ ෆැක්ස් අංකය : 2445393

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔf්ප් සිලෝන් ලිමිටඩ්,
අංක 129, තිස්ස පාර,
අම්බලන්තොට.
දුරකථන අංක : 047-2223816,
047-2223818-9,
ෆැක්ස් අංකය : 047-2223816.

09-1132

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

එස්. ආර්. ජී. එච්. ඩී. සමරසිංහ සහ එච්. එස්. සමරසිංහ,
ගිණුම් අංක : 0029 5000 6202.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.12.16 දින යෝජනා කොට සම්මත කර ගනු ලැබ 2005.03.25 දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2005.03.30 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත්වල ද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අනූතුන් ලක්ෂ හැට දෙදහස් හයසිය හැට එකයි ශත අනූ තුනක (රු. 9,362,661.93) මුදල සමඟ, රුපියල් හැත්තෑ අට ලක්ෂ පනස් අට දහස් දෙසිය පනස් එකයි ශත අනූ තුනක (රු. 78,58,251.93) මුදල සඳහා 2004 අගෝස්තු මස 31 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තව දුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් වියදම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාට් විසින් 2007.10.19 දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරනකුරු කෝරළේ, මාවත පත්තුවේ, කෑගල්ල නගර සභා සීමාව ඇතුළත කෑගල්ල නුවර පාරේ පිහිටි වරිපනම් අංක 142 දරන වලව්වේවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ටී. එම්. ටී. බී. තෙන්නකෝන් විසින් සාදන ලද 1997 ජුනි මස 09 දාතම (එහෙත් 1992 පෙබරවාරි මස 21 දින වශයෙන් ලියාපදිංචි කර ඇති) හා අංක 1422 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත, උතුරට : කොළඹ-නුවර පාරේ පදික වේදිකාව ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : අංක 191A වන පිඹුරේ ලොට් 2 ද සහ බටහිරට : නැසීගිය කේ. නුගපිටියගේ ඉඩම ද මායිම් වන, කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව 431/275හි ලියාපදිංචි කොට ඇති එකී අංක 1422 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම් කොටස එහි තිබෙන ගොඩනැගිල්ල, පස, ගහකොළ, වගාවන් සහ අනෙකුත් සියළු දේ සමග ය.

ඉහත කී කෑගල්ලේ නුවර පාරේ පිහිටි වලව්වේවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ටී. එම්. ටී. බී. තෙන්නකෝන් විසින් සාදන ලද 1997 ජුනි 09 දාතම (එහෙත් 1992 පෙබරවාරි මස 21 දින වශයෙන් ලියාපදිංචි කර ඇති) හා අංක 1422 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට නිරූපිත උතුරට : කොළඹ නුවර පාරේ පදික වේදිකාව ද, නැගෙනහිරට : ලොට් 3 ද, දකුණට : අංක 191A පිඹුරේ ලොට් 2 ද සහ බටහිරට : ලොට් 1 ද මායිම් වන කෑගල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 431/281හි ලියාපදිංචි කොට ඇති එකී අංක 1422 පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි ඇති ගොඩනැගිල්ල, පස, ගහකොළ, වගාවන් සහ අනෙකුත් සියළු දේ සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-1154/4

## මහජන බැංකුව – මැජස්ටික් සිටි ශාඛාව

### 19986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ සියඹලාපේ ගමේ පිහිටි ප්‍රමානයෙන් පර්චස් තිස් එකයි දශම පහයි හයක් (අ. 0 රූ. 0 පර්. 31.56) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2007.10.14 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා.–* 2007.05.25 දින *රජයේ ගැසට් පත්‍රයේ ද* 2007.06.04 දින දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන් යන පුවත්පත්වල ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.–* මහරගම සිට කඩුවෙල දක්වා පැමිණ බැලුම්මහර පාරේ, බියගම බෙල්ලකැපුව හන්දිය නමැති ස්ථානයෙන් වමට හැරී සමෘර්ධි මාවත නැමැති පාරේ කිලෝ මීටර් 1ක් පමණ ගිය විට වම් පසට ගලහිටියාව පාර හමුවේ. එහි කිලෝමීටර් 1ක් පමණ ගිය විට දකුණු පසට ගලහිටියාව පහල පාර හමුවන අතර එහි කිලෝමීටර් 2ක් පමණ ගිය විට වම් පසට ඇති කුඩා වෙළඳ සැල අසලින් වමට ඇති අඩි 10 ක් පළල පාරෙන් මෙම දේපළට ප්‍රවේශ විය හැක.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ 01, ආදිපාද වීදියේ අංක 11 (බටහිර 1) මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරි මහතා වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 2393678, 2387068, ෆැක්ස් අංකය 2435977.

හිමිකම් සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කරන ලද මුදල් දින 20ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
මුළු දිවයිනටම සාම විනිසුරු.

*කාර්යාලය* : 25 සී, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
011-5756356.

*නිවස* : අංක 11/55, කුඩාබුත්ගමුව,
අංගොඩ.
011-2419126.

09-1119

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

### අක්කර 40ක් විශාල අගනා ඉඩමක් පුත්තලම දිස්ත්‍රික්කයෙන්

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, අක්කරෙයි පත්තුවේ තොටපොළ ග්‍රාමයේ පිහිටි මිනින්දෝරු එම්. බී. රණතුංග විසින් මැන සාදන ලද අංක සී 54 හා වර්ෂ 1972ක් වූ ජනවාරි මස 30 දින දරන සැලැස්මේ පෙන්වා ඇති මල්ලිකා ගෲප් හි ලොට් 1 දරන බිම් කැබැල්ලෙහි පිහිටි වතු වගාවන් හා ස්ථානය බලයලත් මිනින්දෝරු එම්. බී. රණතුංග විසින් සාදන ලද අංක සී 15 හා 1968 අගෝස්තු මස 26 වැනි දින දරන සැලැස්මේ සී 22 හි අතුරු බෙදීමක් වන එකී ලොට් 1 ට මායිම් උතුරට : ලොට් 54 හි ලොට් 2, නැගෙනහිරට : පාර ද, දකුණට : මල්ලිකා ගෲප් වතුයායේ කොටසක් සහ බස්නාහිරට : පාරද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර තහළිහ (අ. 40 රූ. 0 පර්. 0) විශාල වූ එහි අංක 54 දරන සැලැස් ම ප්‍රකාරවය. පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 10/215 දරන හිමිකම් යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද ඉඩම වේ.

රුපියල් තිස් ලක්ෂ තිස්අට දහස් හාරසියහැට එකයි ශත හතලිස් අට (රු. 3,038,461.48) ක මුදලක් 2004 පෙබරවාරි මස 13 වන දින පටන් සම්පූර්ණයෙන් ගෙවන තෙක් වර්ෂයකට 23% බැගින් සහ එකී පොලිය මත පිරිවැටුම් බදු නඩු ගාස්තු සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද අයකර ගැනීම සඳහා ඉහත සඳහන් දේපළ රත්මලාන සිරිමල් උයනේ අශෝක මාවතේ, අංක 07 දරන ස්ථානයේ පදිංචි ඇන්ඩ්‍රෙ විල්හෙල්ම් බල්තසාර් යන අයට විරුද්ධව කොළඹ 02 නවම් මාවතේ අංක 46/38 දරන ස්ථානයේ පිහිටා ඇති ෆෝර්බ්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් ගල්කිස්ස දිසා අධිකරණයේ නඩු අංක 110/04 එම් බී දරන නඩුවෙන් මා වෙත පවරන ලද කොමිසම් මත ඉහත සඳහන් දේපළ වර්ෂ 2007ක් වූ ඔක්තෝබර් මස 24 පස්වරු 1.30 ට ගල්කිස්ස දිසා අධිකරණ පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.–* පුත්තලම කොළඹ ප්‍රධාන මාර්ගයේ සැතපුම් 78 1/2ක් පමණ ගොස් පලාවී මංසන්දියෙන් වමට හැරී කල්පිටිය මාර්ගයේ තවත් සැතපුම් 3ක් පමණ සෙතපොල මංසන්දිය දක්වා ගොස් නැවතත් වමට හැරී තොටපොළ පාරේ සැතපුමක් පමණ ගොස් දකුණට හැරී වැලි පාරේ තවත් සැතපුම් දෙකක් පමණ ගිය පසුව මෙම දේපළට පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවලේ මවෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය. (1) ගැණුම් මිලෙන් 25%ක් ද, (2) පළත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) වෙන්දේසි සඳහා දරන්නට වූ වියදම් ද, (5) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ ගාස්තු වශයෙන් රු. 2,000 (6) ලිපිකරු හා ගෝෂක ගාස්තු වශයෙන් රු. 1,000 ක මුදලක් ද වන අතර ගැණුම් මිලේ පර්ශේෂය වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගල්කිස්ස දිසා අධිකරණයේ අංක 110/04 එම් බී දරන මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩිදුර විස්තර සහ අදාළ ලියවිලි පරීක්ෂා කිරීම සඳහා කොළඹ 03, කර්නල් ටී. ජී. ජයවර්ධන මාවතේ (පාර්ම් ග්‍රෝව්) අංක 26/1 දරන ස්ථානයේ පිහිටි නීතිඥවරුන් වන ප්‍රසන්න එස් ගුණවර්ධන මහතාගෙන් විමසන්න. දුරකථන අංක 5367788, 2372162, 2372163, 2372164, 2372165 හෝ 071 266102.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක: 2873656, ෆැක්ස් අංකය :2871184 ජංගම: 0777-672082.

09-1109

## ලංකා බැංකුව

### ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 309/05.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007.07.13 දිනැති අංක 1506 දරන *ගැසට් පත්‍රයේ* හා 2007.07.09 දිනැති ඩේලිනිව්ස් දිනමිණ සහ තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2007.11.07 වැනි දින පෙ. ව. 10.30 ට කුලියාපිටිය, පන්නල පාර, අංක 56 හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියස් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ රෙකොපත්තු කෝරළයේ, අමුණුගම ග්‍රාමයේ පිහිටි "දෙණියවත්ත" නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2005.06.09 දිනැති අංක 5076 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට අංක එෆ්. වී. පී. 1492 දරන පිඹුරේ ලොට් 77 හෙන්ද්‍රික්වත්ත ද, නැගෙනහිරට බලයලත් මිනින්දෝරු ටී.ඒ. ආර්. තාඹුගල විසින් සාදන ලද අංක 606 දරන පිඹුරේ විස්තර කළ එම ඉඩමේ කොටසක් ද, දකුණට රත්ජන ගම සිට කොළඹ කුරුණෑගල ප්‍රධාන පාර දක්වා පාර සහ එකී අංක 5076 දරන පිඹුරේ ලොට් 2 (පර්වතය) සහ එකී අංක 5076 දරන පිඹුරේ ලොට් 3 (පර්වතය) ද, බස්නාහිරට එකී අංක 5076 දරන පිඹුරේ ලොට් 2 සහ 3 (පර්වතය) සහ අංක 605 දරන පිඹුරේ එම ඉඩමේ ඉතිරි කොටසක් වූ ලොට් 2 ද, මායිම්ව රූඩ් තුනයි පර්චස් තිහයි දශම අටයි තුනක (අ. 0 රූ. 3 පර්. 30.83) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ වැවිලි සහ සියලු දේ වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එප් 1268/117 හි ලියාපදිංචි කර ඇත.

2. එකී අමුණුගම ග්‍රාමයේ පිහිටි "දෙණියවත්ත" නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2005.06.09 දිනැති අංක 5076 දරන පිඹුරේ ලොට් 2 (පර්වතය) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල එකී අංක 5076 දරන පිඹුර අනුව උතුරට නැගෙනහිර සහ දකුණට එකී අංක 5076 දරන පිඹුරේ ලොට් 1 ද, බස්නාහිරට අංක 605 දරන පිඹුරේ මෙම ඉඩමේ ඉතිරි කොටසක් වූ ලොට් 2 ද, මායිම්ව පර්චස් හතයි දශම දෙකයි බිංදුවක (අ. 0 රූ. 0 පර්. 7.20) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එප්. 1268/118 ලියාපදිංචි කර ඇත.

3. එකී අමුණුගම ග්‍රාමයේ පිහිටි "දෙණියවත්ත" නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2005.06.09 දිනැති අංක 5076 දරන පිඹුරේ ලොට් 3 (පර්වතය) වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල එකී අංක 5076 දරන පිඹුර අනුව උතුර නැගෙනහිර, දකුණ හා බස්නාහිරට එකී අංක 5076 දරන පිඹුරේ ලොට් 1 ද, මායිම්ව පර්චස් එකයි දශම නවයයි අටක (අ. 0 රූ. 0 පර්. 1.98) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 1268/119 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ජී. ජයවීර,
කළමනාකරු.

ලංකා බැංකුව,
2 වැනි නගර ශාඛාව,
කුරුණෑගල.

09-1112

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - මොණරාගල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 1999.11.10 දින සහ 2000.09.20 වන දිනයන්හි පිළිවලින් අංක 7201 සහ අංක 7952 දරන බැදුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවී ම සුවන්ද හෙන්නැදිගේ පියසේන ද සිල්වා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2007 ඔක්තෝබර් මස 16 වැනි දින පෙ. ව. 11 ට ආරම්භ පරිදි දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ බුත්තල, වැදිරට කෝරළේ බුත්තල, මූප්පන මොණරාගල නගරයේ පිහිටි එගොඩවත්තහේන, නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩමේ කොටස වන මොණරාගල දිස්ත්‍රික් උසාවියේ 261 දරන නඩුවේ ගොනු කර ඇති සහ බලයලත් මානක එච්. ඩී. ඕරන්ස් විසින් මැන සාදන ලද 1970.11.06 දිනැති අංක 699 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1 ලෙස නිරූපිත ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

විශාලත්වය පර්චස් 18.60 යි

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.07.06 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2007.08.06 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 දුරකථන අංක 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

09-1117

---

## මහජන බැංකුව - කෙසෙල්වත්ත ශාඛාව

### 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය යටතේ විකිණීම

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාතේ ගඟ පහල කෝරලේ (දැනට ගම්පහ ලියාපදිංචි කිරීමේ කාර්යාල සීමාව තුළ) ගම්පොල, මහනුවර පාරේ පිහිටි කලින් වරිපනම් අංක 115 වූ දැනට වරිපනම් අංක 188 දරන "හාලිඇල " නමැති ඉඩමේ ලොට් ඒ වශයෙන් ලකුණු කොට දක්වා ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස ප්‍රමාණයෙන් අක්. 0 රූඩ් 0 පර්. 9.46) එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ වගාවන් හා සැම සියලු දේ සමග.

*දේපළ වෙත ප්‍රවේශය.–* ගම්පොල සිට මහනුවර මාර්ගය ඔස්සේ කි. මී. 1/2ක් පමණ පන්සල පාර දක්වා ගොස් එම පන්සල පාර පසුකළ විටම අංක 188 දරන ස්ථානයේ පිහිටි දේපල හමුවේ. මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත කී දේපල මා විසින් 2007 ඔක්තෝබර් මස 20 වැනිදා සෙනසුරාදා පෙ. ව. 11.30 ට ආරම්භව පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 1996.03.08 වැනිදා *රජයේ ගැසට් පත්‍රය* හා 1996.03.08 වැනිදා ඬේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් පුවත්පත්ද විකුණුම් නිවේදනය සඳහා 2007.09.28 දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

*ගෙවන පිළිවෙල .–* සාර්ථක ගැණුම්කරු විසින් මිළ තීන්දු වූ වහාම පහත සඳහන් ගාස්තු මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය් (10%) ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු පළාත් අධිකාරි බද්ද 1% (සියයට එකයි),
3. විකුණුම් මිළෙන් සියයට දෙකහමාරක් (2 2/2%) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්ත රු. 500 ක් ද,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව) වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කොළඹ 1, ආදිපාද වීදියේ, අංක 11 මහජන බැංකුව කලාප කාර්යාලය (බස්නාහිර 01), සහකාර සාමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතුය. දුරකථන අංක : 238706 2393678, 2344985.

ඉහත කී මුදල ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල රාජසන්තක කොට දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතු වේ.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්,
රජයේ සහතික ලත් විශේෂඥ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දේපළ නියෝජිත.

අංක 42, දුටුගැමුණු වීදිය, පාමංකඩ, දෙහිවල,
දුරකථනය : 2814743 දුරකථන/ෆැක්ස් අංකය : 2814742/2814744.
ක්ෂණික ඇමතුම් : 0772250422.

09-1130

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ කෙරෙන විකිණීම පිළිබඳ දැනුම්දීම

ගිණුම් අංකය : 0010 5002 3350.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ 2004.06.23 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලදුව, 2004.07.16 දින *ගැසට් පත්‍රයේ* සහ 2004.07.02 වැනි දින දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් යන දිනපතා පුවත්පත්වල පළ කරන ලද යෝජනා සම්මතය ප්‍රකාර රුපියල් හැටපහ් ලක්ෂ හැත්තෑ එක් දහස් තුන්සිය අනූතුනකුත් ශත විසිහතක් (රු. 6,571,393.27) පමණක් වූ මුදල සහ 2004 මාර්තු මස 24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් තිස්දෙලක්ෂ හතලිස් හතර දහසක් (රු. 3,244,000) සඳහා වර්ෂයකට සියයට දොළහකුත් දශම නවයක් (12.9%) බැගින් සහ රුපියල් පහලොස් ලක්ෂයක් (රු. 15,00,000) සඳහා

සියයට දහහතර (14%) බැගින් වූ පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරා ඇති වෙනත් ගාස්තු ද, ඉන්පසුව යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ 2007.10.16 දින පෙ. ව. 10.30, ප. ව. 3.00 සහ ප. ව. 3.30 කොළඹ, බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාර්ට් මහතා විසින් ඒ දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

*පළමුව–*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක කෝරළේ, නැගෙනහිර රොටුඹ ග්‍රාමයේ පහිටි "මුත්තෙට්ටුමුලහේන" නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් මැන සාදන ලද 1997 පෙබරවාරි මස 07 දාතම හා අංක 2220ඒ දරන පිඹුරේ (පැරණි පිඹුර එෆ්වීපී 44) ලොට් 869 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට: එම ඉඩමේම ලොට් 888 ද, නැගෙනහිරට: එම ඉඩමේම ලොට් 868 ද, දකුණට :එම ඉඩමේම ලොට් 885 සහ බස්නාහිරට: එම ඉඩමේම ලොට් 870 ද, මායිම් වන, ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් දහයක් (අ. 2, රූ. 0, පර්. 10) වන මොරවක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රුව ජී 80/28හි ලියාපදිංචි කොට ඇති එකී ලොට් 869 දරන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ ඉඩම එහි පිහිටි පස, ගහකොළ, ගොඩනැගිලි සහ සෑම සියලු දේත් සමගය.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක කෝරළේ, නැගෙනහිර රොටුඹ ග්‍රාමයේ, පිහිටි "මුත්තෙට්ටුමුලහේන" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් මැන සාදන ලද 1997 පෙබරවාරි 08 දාතම හා අංක 2220බී දරන පිඹුරේ (පැරණි පිඹුර එෆ්වීපී 44) ලොට් 843 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට: එම ඉඩමේම ලොට් 845 ද, නැගෙනහිරට: එම ඉඩමේම ලොට් 842 ද, දකුණට :එම ඉඩමේම ලොට් 853 සහ ලොට් 852 ද සහ බටහිරට: එම ඉඩමේම ලොට් 844 ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තිස්නවයක් (අ. 0, රූ. 0, පර්. 39) වන මොරවක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රුව ජී 80/28හි ලියාපදිංචි කොට ඇති එකී ලොට් 843 දරන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ ඉඩම් එහි පිහිටි පස, ගසකොළ, ගොඩනැගිලි සහ සෑම සියලු දේ සමග ය.

*දෙවනුව.*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර ඇතුළත හිත්තැටියේ පිහිටි හුනුඇලවිල ලොට් ඒ නමැති ඉඩමේ ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : එම ඉඩමේම කොටසක් ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එම ඉඩමේම ලොට් 2 ද, සහ බස්නාහිරට : එම ඉඩමේම කොටසක් ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිදෙකයි දශම පහක් වන (අ. 0, රූ. 0, පර්. 22.5) බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් මැන සාදන ලද 1997 මාර්තු 18 දාතම හා අංක 5627 දරන පිඹුරේ දැක්වෙන මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රුව ඒ 406/247 හි ලියාපදිංචි කොට ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ ඉඩම් කොටස එහි පිහිටි ගසකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සෑම සියළු දේ සමග.

එකී අංක 5627 දරන පිඹුරේ නැගෙනහිර මායිමට ඇති මාර්ගය මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගය.

ඉහත කී හිත්තැටියේ පිහිටි "හුණුඇලවිල ලොට් ඒ" නමැති ඉඩමේ ලොට් 2 වශයෙන් ලකුණු කොට දක්වා ඇති බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් මැන සාදන ලද 1997 මාර්තු 18 දාත ම හා අංක 5627 දරන පිඹුරේ නිරූපිත උතුරට එම ඉඩමේම ලොට් 1 ද, නැගෙනහිරට : මාර්ගය ද, දකුණට : එම ඉඩමේම ලොට් 3, 4, 5 ද සහ බටහිරට : එම ඉඩමේම කොටසක් ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිතුනයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 23.5) වන මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රුව ඒ 406/248හි ලියාපදිංචි කොට ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ ඉඩම් කොටස එහි පිහිටි ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සෑම සියලු දේත් සමග ය.

*තෙවනුව*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර ඇතුළත දෙල්කඳ පාරේ පිහිටි (වරිපනම් අංක 2482 දරන) දැනට "අලව්ව ගාඩින්ස්" යනුවෙන් හැඳින්වෙන, කෙන්දවෙල, ඊරියගහවල, පිට්ටනිය *නොහොත්* වත්ත, කැබෙල්ලගහවත්ත, අමාගෙවත්ත සහ ඕවිට යනුවෙන් හැඳින්වෙන ඒකාබද්ධ ඉඩම් වලින් සීමා නිර්ණය කළ ලොට් ඒ හි ලොට් 13 යන උතුරට : ලොට් (ඩී පහළොවක පාර) ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 12 ද, දකුණට : ගාල්ල වලව්වේ පැපිලිය පිට්ටනිය ද සහ බටහිරට : මහබැද්දේ කොරටුව ද මායිම් වන බලයලත් මිනින්දෝරු එෆ්. විජේවීර විසින් මැන සාදන ලද 1969 මාර්තු මස 22 දාතම හා අංක 1115 දරන පිඹුරේ නිරූපිත ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) වන මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 421/214 වෙළුමේ/පත්‍රුවේ ලියාපදිංචි කර ඇති සීමා නිර්ණය කළ ලොට් ඒ හි ලොට් 13 ඉඩම් කොටස එහි පිහිටි සියලුම ගොඩනැගිලි හා සමගය.

ඉහත කී ලොට් 13 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම ප්‍රතිමිණුම් කොට, බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. රිස්මි විසින් සාදන ලද 2000 අප්‍රේල් මස 18 දාතම හා අංක 1053 පිඹුරේ ලොට් 13 වශයෙන් දැන් නිරූපිතය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-1154/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.